## සෞඛ්‍ය අමාත්‍යාංශයේ
## පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී තනතුරේ පුහුණුවට අභ්‍යාසලාභිනියන් බඳවා ගැනීම පිණිස අන්තර්ජාලය හරහා ඉදිරිපත්කල යුතු අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය සහ අන්තර්ජාලය හරහා අයදුම්පත සම්පූර්ණ සඳහා ලබාදී ඇති උපදෙස් ඉතා හොඳින් කියවන්න.

අයදුම්පත් ඉදිරිපත් කල යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ www.health@gov.lk නිළ වෙබ් අඩවිය ඔස්සේ පමණි.

මේ සඳහා සුදුසුකම් ලබන්නේ **2015** හෝ **2016** හෝ **2017** යන වර්ෂ වලින් එක් වර්ෂයකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයට ඕනෑම විෂය ධාරාවකින් පෙනී සිට සමත් වූවන් පමණි.

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2021.02.01 වේ.

එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කල හැක්කේ එක් අයදුම්පතක් පමණි.

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමේදී අයදුම්කාරිය සතුව තිබිය යුතු ලේඛන හා තොරතුරු.**

**සෑම අයදුම්කාරියෙකුටම පහත ලේඛණ / තොරතුරු තිබිය යුතුය ;**

- **ජාතික හැඳුනුම්පත**
- **උස (සෙ.මී) වලින් දැක්විය යුතුය**
- **ඇමතුම් ලබාදියහැකි ජංගම දුරකථන අංකයක්**
- **ගැසට් පත්‍රයේ 6.2. ඡේදය අනුව රු. 500/- ක ගාස්තුව බැංකුවට ගෙවීමෙන් පසු ලබාගත් රිසිට්පත**

ජංගම දුරකථන අංකයක් ඇතුලත් කල යුතුය. අයදුම්කාරියට තමාගේ සහ පියාගේ හෝ මවගේ හෝ භාරකරුගේ හෝ ජංගම දුරකථන අංකයද ඇතුලත් කල හැකිය.

ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් හෝ මුදල් තැම්පත් කිරීමේ යන්ත්‍රයකින් හෝ අන්තර්ජාල බැංකු සේවාවක් මගින් හෝ රු.500/- ක මුදලක් ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ ගිණුම් අංක 7041318 දරණ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවා ලබාගත් ලදුපතේ මුද්‍රිත අංකය අයදුම්පතේ නියමිත ස්ථානයට ඇතුලත් කල යුතුය. මුදල් ගෙවීමෙන් පසු ලබාගත් රිසිට්පත අයදුම්කාරිය සන්තකයේ සුරක්ෂිතව තබා ගත යුතුය. (ටෙලර් යන්ත්‍රයක් මගින් ගෙවීම් සිදුකලේ නම් එම රිසිට්පතෙහි සඳහන් දත්ත පසුකාලීනව මැකී යාමට ඉඩ ඇති බැවින් මුල් පිටපතට අමතරව එහි ඡායා පිටපතක්ද තබාගන්න)

**අයදුම්පත ඉදිරිපත් කරන ක්‍රියාවලියෙහි පියවර ;**

අන්තර්ජාලය හරහා අයදුම්කිරීම ⟹ සම්පූර්ණ කරන ලද අයදුම්පත උඩගත කිරීමෙන් පසු ලැබෙන අංක **5** කින් යුත් කේතය, අයදුම්පතෙහි මුද්‍රිත පිටපත් පසුව ලබාගැනීමේ පහසුව සඳහා සුරක්ෂිතව තබාගන්න.

- අන්තර්ජාල සම්බන්ධතාවයේ බාධාවීම් හේතුවෙන් හෝ වෙනත් හේතුවක් නිසා හෝ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය අවසන් කල නොහැකි වුවහොත්, එය නව අයදුම්පතක් ලෙස නැවත සම්පූර්ණ කල යුතුය.

- සම්පූර්ණ කරන ලද අයදුම්පත අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමෙන් පසුව එහි මුද්‍රිත පිටපතක් ලබාගෙන ඔබ සන්තකයේ තබාගන්න. <u>එය තැපෑලෙන් එවීම නොකල යුතුය</u>

**අන්තර්ජාලය හරහා අයදුම්පත සම්පූර්ණ කිරීමේදී සැලකිය යුතු කරුණු ;**

1. අයදුම්පත සම්පූර්ණ කල යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

2. අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී යොදාගත් ජාතික හැඳුනුම්පත් අංකයම භාවිතා කල යුතුය.

3. අදාල විභාග අංක ඇතුලත් කල පසු අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ස්වයංක්‍රීයව උත්පාදනය වේ. කෙසේ වෙතත් එම ප්‍රතිඵල වල කිසියම් වෙනසක් තිබේ නම්, ඔබ සතුව ඇති ප්‍රතිඵල ලේඛණයේ සඳහන් ප්‍රතිඵල ඊට පහලින් ඇති කොටසෙහි සඳහන් කල යුතුය.

<u>විශේෂ අවධානයට</u>

- ගැසට් නිවේදනය සහ ඉහත උපදෙස් ඉතා හොඳින් කියවා තේරුම් ගෙන මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කාරියන්ට විද්‍යුත් අයදුම්පත පිරවීමේදී කිසියම් තාක්ෂණික ගැටළුවක් මතුවුවහොත් එම තාක්ෂණික ගැටළුව විසඳා ගැනීම සඳහා පමණක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ සම්බන්ධීකරණ අංශයේ 0112 340 007 දුරකථනයට සතියේ දිනවල (රජයේ නිවාඩු දින හැර) ඇමතීමෙන් උපදෙස් ලබාගත හැකිය.

**වෙනත් කරුණු පිළිබඳව විමසා ඇමතුම් ලබාදීමෙන් වලකින්න.**